# Google Summer of Code

## ඔබ විවෘත මෘදුකාංග කේතායනය කරන්න කැමතිද ?
## ඔබ මුදල් උපයන්න කැමතිද ?
## ඉතින් ඔබට මේ දෙකම කරන්න බැරි ඇයි ?

2007 වසරේදී පමණක් ගූගල් ගිම්හාන කේත තරඟාවලිය(Google Summer of Code) රටවල් 90කට අධික ශිෂ්‍යයන් 900ක් සහ උපදේශකයන් 1500 කට ආසන්න සංඛ්‍යාවක් විවෘත මෘදුකාංග(Open Source) ව්‍යාපෘති 130කට අධික ගණනකට සහභාගි කරවා ඇත. එය තවත් ඉදිරියට ගෙනයමින් 2008 වසර මෙතෙක් පැවැති සාර්ථකම තරඟාවලිය බවට පත් කර ගැනුමට උපදේශකවරුන් සහ ශිෂ්‍යයන් අප හා අත්වැල් බැඳ ගනු ඇතැයි අප බලාපොරොත්තු වෙමු. එයට අමතරව ශිෂ්‍ය දායකයන්ට ඔවුන්ගේ ව්‍යාපෘති සාර්ථකව කර ගැනීමට අපි ඇ. ඩොලර් 4500 ක (රු. 500,000 කට ආසන්න) දීමනාවක් ඔබට සපයනු ඇත.

ගූගල් ගිම්හාන කේත තරඟාවලියේ මූලික අරමුණ වනුයේ ශිෂ්‍යයන් විවෘත මෘදුකාංග ගොඩ නැගීමට දායක කර ගැනීමය. 2005 දී මෙම වැඩසටහනට මුල්ගල තැබුනේ අරමුණු කිහිපයක් ඇතිවය.

- ආධුනික පරිගණකකරුවන් විවෘත මෘදුකාංගකරණය සඳහා පෙළඹවීම.
- පරිගණක ආශ්‍රිත ක්ෂේත්‍රයන් හදාරන ශිෂ්‍යයන්ට ගිම්හාන නිවාඩු කාලයේදී ඔවුන්ගේ ක්ෂේත්‍රයට අදාල ව්‍යාපෘති වල නියැලීමට අවස්ථාව ලබා දීම.
- ශිෂ්‍යයන්ට වෘත්තිය මෘදුකාංගකරන යෙදීම් වල යෙදීමට අවස්ථාව ලබා දීම. (උදා: දුරස්ථ සහ විසිරුණු මෘදුකාංගකරනය, මෘදුකාංග බලපත්‍ර සහ නීතිමය යෙදීම්, කණ්ඩායමක් ලෙස සාකච්ඡා කරමේදී පිලිපැදිය යුතු සිරිත් විරිත්).
- තවත් විවෘත මෘදුකාංග කරලියට ගෙන ඒම සහ එම මෘදුකාංග සියලු දෙනාගේ සුබසිද්ධිය සඳහා යෙදවීම.
- නව සාමාජිකයන් සහ මෘදුකාංගකරුවන් විවෘත මෘදුකාංග ව්‍යාපෘති වලට හඳුන්වා දී එම ව්‍යාපෘති වලට සහාය දීම.

ගූගල් සමාගම 2008 මාර්තු 3 සිට 12 දක්වා විවෘත මෘදුකාංග ව්‍යාපෘති වලින් අයැදුම්පත් බාර ගනු ලබන අතර මාර්තු 24 සිට 31 දක්වා කාලය තුල ශිෂ්‍ය අයැදුම්පත් බාර ගනු ඇත.

අයැදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම්, අයැදුම් කිරීමේ පටිපාටිය සහ අනෙක් වැඩි විස්තර පහත සඳහන් යොමුවෙන් ලබා ගන්න.

**http://code.google.com/soc/**

Translations provided by Buddhika Laknath <blaknath@gmail.com>